ඉන්දීය ලේඛක ආර්. කේ. නාරායන්ගේ The Shelter කතාවේ පරිවර්තනය

රැකවරණය

පරිවර්තනය
ආණමඩුවේ විජේසිංහ

වැස්ස කඩා හැළුණේ හදිසියෙනි. වැස්සෙන් බේරීමට දුවයන්නට තිබුණ එකම ආවරණ ස්ථානය වූයේ, දැ-වැන්ත කඳක් සහිතව, ඉහළ අතුපතර හොඳින් විහිදී ගිය පාර අයිනේ වූ දැවැන්ත නුග ගස ය. තමා සිටින දිසාවට ඉඳගිට ගහන දිය සුළඟින් සමඟ, සට පට ගා වැටෙන දියබිඳු දෙස ඔහු මැදහත් සිතින් බලා සිටියේය. සම්පූර්ණයෙන්ම තෙත බරිත වූ දඩාවතේ යන බල්ලෙක් අඟල ගසා දමන අයුරු ද පාර අයිතේ සිටි මී හරක් දෙන්නෙක් සුළඟට වැටුණු නුගකොළ කනහැටි ද ඔහු බලා සිටියේය. ඇඳවී. වකුටු වී ගිය නුග ගසේ සුවිශාල කඳට මුවා වී තවත් සිකිවකු සිටගෙන සිටින බව, ඔහුගේ දෙනෙතට ලක්විය. යාන්තමට විහිදෙන මල් සුවඳක් තමා දෙසට පාව එන බවක් ද ඔහුට දැනෙන්නට විය. තව දුරටත් තම කුතූහලය දරා සිටීමට නොහැකි බව ඔහුට හැඟුණි. නුග ගසේ කඳ අසලට ගිය ඔහුට මුහුණ ට මුහුණ ලා එහි සිටි ඇයව හමුවුණි.

"ඕ.... හ්...." තම මුල්ම ප්‍රතිචාරය හැටියට ඔහුට හයියෙන්ම කියවීණි. තමා මහත්වූ කාලකණ්ණි අවුලකට පත්වුණාක් මෙන් ඔහුට දැනුනි. ඔහු දැක බියට පත්වුණාක් බඳු වූ ස්ත්‍රිය තම කෑ ගැසීම යටපත් කර ගත්තාය. තම කාලකණ්ණි නොසන්සුන් කම පහව ගිය පසු

"කනගාටුවෙන්ඩ එපා, මං අහකට යන්නම්" ඔහු කියා සිටියේය. එහි කිසියම් අමන, තකතීරු ලැ*ජාවක් බඳු දෙයක් ඔහුට දැනුණේ වෙන්වෙලා ගොඩක් කලකට පසුව මෙසේ, යළි තම බිරිඳ දැකගන්නට ලැබීමෙනි. ඔහු යළි තමා කලින් සිටි තැනට ගියේ ඇඟෙන් ඈත්වෙමිනි. නමුත් ලඥයි ඔහේ මෙතෙන්ට ආවේල කියා අසන්නට ඔහු ආපසු ඈ සිටින තැනට ගියේය. ඇය පිළිතුරක් නොදෙයි කියා ඔහු බිය වූ නමුත් "වැස්ස හින්දා" යෑසි ඇය කීවාය. "ඕ...හ්..." කියා යළි ඔහුට ඉබේටම කියවුණේ, ඇය එම වචන දෙක කීවේ විහිළුවකට ගනිමින් යෑසි ඔහුට හැඟුණ නිසාය.

"ඕ...හ්" යයි යළි පැවසූ ඔහු ඇය සමඟ සිනා-සෙන්නට මෙන් උත්සාහ කළේය.

"මාත්... මෙතෙන්ට... ආවේ... වැස්ස හින්දා තමයි" ඔහු කියා සිටියේ මුග්ධ හැඟීමකින් වෙළීගෙන ය. පිළිතුරු ලෙස ඇය කිසිවක් නොකීවාය. කාලගුණය කවදත් කතාවට මාතෘකාවක් නිසා, එහිම එල්ලීගෙන "හිතුවෙවත් නැති වැස්සක් තමයි කඩා වැටුණේ" ඔහු කීවේ බලාපොරොත්තු සුන් වූ විලාශයෙනි.

ඇය එයට ද කිසිදු ප්‍රතිචාරයක් නොදී ඉවත බලා ගෙනම සිටියාය. තවදුරටත් ඔහු කාලගුණ විෂය ඔස්සේ දිගටම කතා කරන්නට උත්සාහ කළේය.

"වැස්ස ගැන පොඩ්ඩක් හරි සැකයක් තිබුණ නම් මට ගෙදර තවතින්නට තිබුණා... නැත්තම් කුඩේ අරං එන්න තිබුනා" ඔහු කී දෙය ගැන ඇය තුච්ඡවකටවත් ගණන් නොගත්තාය. ඒ කියන දෙයට ඇය බිරෙක් මෙන් සිටියා ය.

"මං කියාපු එක ඇහුනද" කියා අසන්නට ඔහුට උවමනා වුව ද, අසයට තරහ එයි කියා ඔහු බිය විය. ඔඹුව නරක් වූ විට ඇය ඕනෑම දෙයක් කිරීමට තරම් බැරිකමක් නැත. අවසාන අර්බුදය සිදුවුණ රාත්‍රිය වන තෙක් ඇඟේ හැඟීම්, සිතුවිලි වල ශක්තිය, පිළිබඳව ඔහු කිසිදිනක දැනගෙන නොතිබුණි.

විවාහ වී ගතකළ, අවුරුදු ගණන තුළ, ඔවුන් තුළ අර්බුද ගණනාවක්ම පැනනැගී තිබිණි. පසයක් හැර පැසයක් ගානේ මෙලොව තුළ වූ හැම දෙයක් පිළිබඳවම මෙන් වෙනස් වෙනස් අදහස් ඔවුහු දැක්-වූහ. හැම ප්‍රශ්නයක්ම ඉක් මහින්ම අර්බුදයක් බවට පත්වුණි. දෙන්නාගෙන් එක්කෙනෙක්වත් එය සුළුකොට තකා නොසලකා හරින්නට සූදානම් වූයේ නැත. ඒ කොඩිවාගේ දෙයක් ද කියනවානම්,

"රේඩියෝ සිලෝන් එකට ඇහුම්කන් දෙනව ද, නැත්නම් ඕල් ඉන්ඩියා රේඩියෝ එකට ඇහුම්කන් දෙනවද, ඉංග්‍රීසි චිත්‍රපටයක්ල බලනව ද, දෙමළ චිත්‍රපටයක් බලනව ද, පිච්ච මලේ සුවඳ ද වැඩියෙන් වටින්නේ, නැත්නම් රෝස මලේ ලස්සන ද වැඩියෙන් වටින්නේ" වැනි දේවල් ය.

යම්කිසි දෙයක් වචන හුවමාරුවකට හැරී, ඉන්පසු එය මානසික ආතතියක් කරා නිර්මාණය වෙයි. නැවත සැනසිළිදායක වාතාවරණයක් ඇතිකර ගැනීමට, දෙ-දෙනා අතර වූ ඛේදය දින ගණනක්ම බලපායි. යළි මිත්‍රත්වයක් ගොඩ නැගීමට තරම්, යම් සැනසිළිදායක තත්ත්වයක් ඇතිවන විට, ඔවුහු මිත්‍රත්වයේ සංගීත භාණ්ඩය වාදනය කරගෙන යති. එය පූජා කුටියේ දෙවියන් ඉදිරියේ ද සංඥ කොට, නැවත එහෙම නොවන බවට සපථ කොට, ඔවුහු සියලු කරදර ධූරිහූත වූවා යයි සලකති. එහෙත් එය පැවතියේ ඉතා කෙටි කලකට පමණි. ලඥදින් පස්සෙ අපි සණ්ඩුසරුවල් වෙන්නේ නෑල කියා පොරොන්දු වූ මුල්ම වගන්තියම, පසය විසිහතරක් ඇතුළත කඩා දමති. අතිකුත් වගන්ති සියල්ලම ද ගෙදර දොර වියදම්, වෙනත් කෑම පිළිබඳ විවේචන, නීතියට අනුව විමර්ශනය වන අය වැය සාකච්ඡා යනාදිය තවදුරටත් ප්‍රලාප බවට පත්වෙයි.

වැස්සේ සිටගෙන සිටින ඔහුට, අයය අතික් කෙරවලේ සිටීම ගැන සතුටක් දැනෙයි. එදා රාත්‍රියේ තමා විසින් අයය එළියට දමා, දොර වැසුවායින් පසුව, ගොඩක් කල්ගත වන තෙක් ම ඈ ගැන තොරතුරක් දැනගැනීමට ක්‍රමයක් ඔහුට නොමැති විය. සුපුරුදු පරිදි ඔවුන් එදින ද රණ්ඩුවූයේ කෑම වෙනුවෙනි. තමා ගෙදරින් පිටවී යන බවට අයය තර්ජනය කළාය.

"ඉතින් පලයන්" යනුවෙන් තරහින් කෑ ගැසූ ඔහු වහාම දොර ඇරියේය. ඇය අඳුරේම පිටවී ගියාය. ඔහු දොරේ යතුරු නොදමා බෙහෙත් වේලාවක්, අයය ආපසු එතැයි යන බලාපොරොත්තුවෙන් බලා සිටියේය. එහෙත් අයය ආපසු නොආවාය.

"නැවත ඔහේ දකින්ඩ හම්බවෙයි කියලා මං හිතුවෙ නෑ" ඔහු කියා සිටියේය.
"ඔහේ හිතුව ද මං වතුරකට පැනලා මැරුණා කියලා" අයය කියා සිටියාය.
"ඔව් මං බයවුණා" ඔහු කීවේය.
"ඔහේ බැලුව ද මාව අතල පහල ළිංවල, පොකුණු වල, නැත්නම් ගඟේ."
"නෑ මං බැලුවෙ නම් නෑ".
"මට පුදුමයි ඔහේ... එච්චර මං ගැන දුක්වුණා කියලා".

"මං දන්නවා ඔහේ ගිලිලා මැරුණේ නෑ කියලා... කොහොමද ඔහේ මට කියන්නේ... මං ඔහේ ගැන බැලුවේ නෑ.... කියලා"

ඔහු ඈ දෙස බැලුවේ කනගාටුවෙනි.

"ඒකෙන් පේන්නේ තමුසෙට හදවතක් නෑ කියන එකයි" අයය අඩිහප්පමින් මෙන් කීවාය.
"ඔහේ එහෙම කියන එක අසාධාරණයි" ඔහු කියා සිටියේය.

"අනේ දෙවියනේ... එහෙනම් ඔබ වහන්සේ... දැන් මගේ චරිතය ගැන කියන්ඩත් පටන් අරගෙන ඈ... අනේ.. මගේ ඉරණමේ තියෙන මුසල කම ද... මේ දැන් වැස්ස කඩා වට්ටලා... මාව මෙතෙන්ට එව්වේ..."

"මං.... නම් කියන්නේ... වැස්ස කඩා වැටුණේ හොඳට කියලා.... අපි ආයෙම එකතු කළා... මේ කාලය තුළ ඔහේ මොනවද කළේ කියල ඇහුවට කමක් නැද්ද."

"ඇයි... මං... උත්තර බඳින්න ඕනෑ ද ඒකට..." අනේ කටහෙණ් තිබූ උද්යෝගයට ඔහු තරමක් පසුබා සිටියේය. තමා චාටුකාරයෙක් හැටියට ඔහුට දැනුණි. අයය ආපසු ගිවිසට කැඳවාගෙන යැමට, අයය කැමැතිකරවා ගැනීමට තමාට හැකිවේද? මේ වාක්‍යය කොතරම් තම දිව අග හලියෑසත් එය එළියට දමන්නට නොහැකිව ඔහු ආපසු බලෙන්ම මෙන් ගිලගත්තේය.

"ඔහේ.... මට මොනවාවෙලා ඇති ද කියල නිකමට හිතල බැලුවේ නැද්ද.... මේ මාස කීපයේ මං මො-නවා කරනවා ඇති ද කියලා දැනගන්ඩ හිතුවේ නැද්ද..."
අයය එයට පිළිතුරු නොදුන්නාය.

අයය කලින්වත් වඩා සැළකිල්ලෙන් වැස්ස වහින හැටි දිහා බලා සිටියාය. හදිසියේම සුළඟේ දිසාව වෙනස්වී ගසාගෙන ආ වතුරෙන් අඟේ මුහුණ නෑවී ගියේය. ඇඟෙන් සමාව ගැනීමක් ලෙස, තම අතේ වූ රෙදි කඩකින් ඇඟේ මුහුණේ වූ වතුර පිසදැමීමට ඔහු වේගයෙන් ඈ වෙත ළං වූයේය. ඔහුගේ ළං වීමෙන් ඇඟේ කෝපය යළි වැඩිවිය.

"මං ගැන කරදර වෙන්නට ඕන් නෑ.." අයය කෑ ගැසුවාය.
"ඔහේ තෙමෙනවා" ඉහළ අත්තකින් වැටෙන වතුර බිඳු ඇඟේ හිසමත පතිත වෙමින් තිබුණි. ඔහු කනස්සල්ලෙන් මෙන් ඈට අත දිගුකරමින් කියා සිටියේ, ලඔහේ තේරුමක් නැතිව තෙමෙනවා..

"ටිකක් මෙහා පැත්තට වුණානම්... ඔහේ කැමති නම් මං ඔහේ ඉන්න පැත්තට ඇවිත්.... හිටගන්නම්ල ඔහු බලාපොරොත්තු වූයේ මහත් සැළකිල්ලකින් ඈ වෙත ළංවීමට ය.

"මං ගැන ඔහේ කනගාටුවෙන්ඩ අවශ්‍ය නෑ" හිටිතැනම හිටගෙන පාරට උඩින් ගලා යන වතුර කඳ දෙස බලාගෙනම අයය කියා සිටියාය.

"මං ඉක්මනට ගිහිල්ලා කුඩයක් හරි, ටැක්සියක් හරි අරගෙන එන්ඩද?"
අයය නිකමට මෙන් ඔහු දෙස බලා අහක බලා ගත්තාය. එසේම ඔහු තවත් මොනවාදෝ ඒ අයුරින්ම කියා සිටියේය.
"හිතුවද මං..... ඔහේගේ සෙල්ලම් බඩුවක් කියලා"

"සෙල්ලම් බඩුවක් කියලා අයයි ඔහේ කියන්නේ... මං එහෙම දෙයක් කීවේ නෑනෙ"
"හිතෙන.... හිතෙන වෙලාවට.... මං අල්ලා ගන්ඩයි.... විසිකරන්ඩයි පුළුවන් කියලද... ඔහේ හිතන්නේ.... ඒවට තමයි... සෙල්ලම් බඩු කියලා කියන්නේ"
"මං කවදාවත් කියලා නෑ... ඔහේට යන්ඩ කියලා" ඔහු කියා සිටියේය.
"මං... තවත් අහන්නේ නෑ... ඔහේ කියන ඒවා එකක්වත්..."
"මට කොච්චර කනගාටුද කියලා කියනවානම්.. සමහරවිට මං මැරෙයි".
"වෙන්ඩ පුළුවන්... ඒ වුණාට ඒක ගිහිල්ලා කියනවා වෙනකාටහරි"

"ඒ වාගේ දේවල් කියන්ඩ මට ඉතින් වෙන සුන්කර ගන්නෙත් නෑ..." අයය කීවාය.
"ඔහේ... මොනවා කරනවද කියලා කියන්නේ නැද්ද..". ඔහු ඇයෑද සිටියේය. අයය අහකට හිස සැලූවාය.
"කවිදෝ කීවා ඔහේ කරන්නේ... හරිජන වැඩ... නැත්නම්.. ඒ වගේ දෙයක් කියලා.. මං කොහොමද ඒවා පස්සෙ හොය හොයා බලන්නේ... මොනවා කරනවද කියලා"
ඊට පිළිතුරු වශයෙන් අයය කිසිත් නොකීවාය.

"ඔහේ මේ හරියෙද ඉන්නේ... හැමදාම... නැත්නම්...?" ඇඟේ ලිපිනය සොයාගැනීමට කරන ඔහුගේ උත්සාහය අවංක එකක් විය. අයය යළිත් වැස්ස දෙස බෙත් යොමුකර බැලූවාය. ඒ සමගම පිළිකුලකින් මෙන් මුණ ඇඹුල් කරගෙන ඔහු දෙස බැලූවාය.

"තවදුරටත් මං වැස්සට දොස් කියන්නේ නෑ... අපට ආයෙ මුණ ගැහෙන්න... එකතුවෙන්න ලැබුණෙ වැස්ස නිසාමයි"
"නෑ කොහොමටවත්.. අවශ්‍යතාවක් නෑ... එහෙම මාව අල්ලන්ඩ බෑ..."
එසේ කියමින් අයය, වේගයෙන් එළියට බැස, දුව යන්නට වූවාය.
"ඔහොම ඉන්න... ඔහොම ඉන්ඩ... මං පොරොන්දු වෙනවා මෙතන ආයෙ කතා නොකර ඉන්ඩ. ආපහු එන්ඩ.. තෙමෙන්ඩ එපා..." ඔහු අයය පසුපස දුවමින් කියන්නට විය,

එහෙත් අයය දුහුල්, සුදු සුවිශාල තිරයක් මෙන් ඇද හැලෙන වැස්ස අතරින් මේ වනවිටත් අතුරුදෑදන් වී තිබිණි.

ධර්ම අවබෝධය තුළින් ජීවිත ආලෝකය ලබන්න
දින 10 ක් යෝගියෙකු ලෙස ගත කරන්න
ආර්යය ඥාන අවබෝධය සඳහා සැකසුනු
භාවනා වැඩසටහන
සියලු ආරාම භාවනා මධ්‍යස්ථානයේ නිර්මාතෘ, ශ්‍රී ලංකාව, ජපානය, මියන්මාරය, තායිලන්තය ඇතුළු රටවල් කෙනෙහිත භාවනා වැඩ සටහන් පවත්වා තමන ඉන්දැනීම් ඇති
පූජ්‍ය බෝධිචිත්තා මෙහෙණින් වහන්සේගේ
මාර්ග උපදේශකත්වයෙන්
2014 දෙසැම්බර් 19 සිට 28 දක්වා
20 දෙනෙකුට පමණක් ඉඩ පහසුකම් ඇත.
රමණීය නිර්මල ප්‍රදේශයේ පිහිටි නිර්මල් කන්ට්‍රි කොටේජස් හිදී
දින 10 ක නවාතැන් පහසුකම්, සියලු ආහාරපාන ඇතුළු මුළු වියදම AUD 490
වැඩි විස්තර හා නවාතැන් පහසුකම් වෙන්කරවා ගැනීම සඳහා අමතන්න
සොයිසා - 0410 240 836 හෝ මිපුර - 0425 801 139
International Centre for Inner Peace ABN : 83 132 935 167 | Postal Address : 2A Clement Street Dandenong, Vic - 3175 | TP : 03 9794 0759